GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

11/01/2012

පුවත්පත් නිවේදනයයි

"වෛද්‍ය නිළධාරීන්ගේ ප්‍රවාහන දීමනා පිලිබඳ අර්බුදය"

දීපව්‍යප්ත සේවාවක් වන ශ්‍රී ලංකාවේ වෛද්‍ය සේවාව රටේහි සෑම ප්‍රදේශයකම සමානාත්මතාවයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන් දැඩි කැපවීමකින් යුතුව කටයුතු කරති.

වෛද්‍යවරුන් හා අනෙකුත් සමාන්තර සේවාවල උසස් නිළධාරීන්ට නිසි පරිදි නිළ ප්‍රවාහන පහසුකම් මේ වන විටත් සපයා දී ඇත. එහෙත් පොරොත්තු සේවාවේ පවා යෙදෙමින් රෝගී ජීවිත සම්බන්දව ඉතාමත් තීරණාත්මක කාර්යභාර්යයක ඉටු කරන වෛද්‍යවරුන් හට නිළ ප්‍රවාහන පහසුකම් සපයා දී නැත. වෙනකක් තබා 2007 දී අනුමත කරන ලද රු 21000 වු ප්‍රවාහන හා පොරොත්තු සේවා දීමනාවෙන් මේ වන විටත් ගෙවන්නේ රු 15000 පමණි. අනුමතකලා වු එම මුදල යාවත් කාලීන කල විට එය රුපියල් තිස්තුන්දාහක අගයක් ගනී. දැනට ගෙවන මුදල එයින් 45 % පමණ වු ඉතාමත් අසතුටු දායක මට්ටිමක් ගනී.

පවතින සමාජ ආර්ථික වටපිටාව යටතේ මෙම තත්ත්වය තවදුරටත් දරා සිටිය නොහැකි ගැටළුවක් බවට පත් වී ඇති අතර, එය ඉදිරියේදී රටෙහි සෞඛ්‍ය සේවාවේ අර්බුදයක් බවට විකාශනය වීමේ අවදානමක් මේ වන විටත් පහළ වී ඇත.

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්